www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද්ධයෙන් විනාශ වූ ශ්‍රී ලංකාවේ යාපනය අර්ධද්වීපය පිලිබඳව එතැන් සිට කෙරෙන වාර්තාවක්

## On-the-spot report from Sri Lanka's war-torn Jaffna peninsula

**අපේ ලියුම්කරු විසිනි**
**2006 අගෝස්තු 18**

උතුරේ යාපනය අර්ධද්වීපය තුල ශ්‍රී ලංකා හමුදාව සහ දෙමල විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර පසු ගිය සතිය පුරාම බියකරු සටන් සිදු වෙමින් තිබේ. හමුදාව සහ ආන්ඩුව සපයන හෝ වාර්තාකරුවන් කිහිප දෙනෙකු පමනක් එහි සිටින ජාත්‍යන්තර ප්‍රවෘත්ති සේවාවන් මගින් සපයන තොරතුරු මත මුලුමනින් ම රැඳෙන කොලඹ ජනමාධ්‍ය එහි සිදුවෙමින් පවතින දෙයින් වාර්තා කරන්නේ ඉතා සුලු වසයෙනි.

ගැටුමේ පරිමාව සහ මරන සංඛ්‍යාව අපැහැදිලි ය. හමුදා ප්‍රකාශක මේජර් ජනරාල් උපාලි රාජපක්ෂට අනුව සොල්දාදුවන් 106 සහ අවම වසයෙන් එල්ටීටීඊ සටන්කරුවන් 700 පසු ගිය සතිය තුල මියගොස් තිබේ. බදාදා කිලාලි ප්‍රදේශයේ දී එල්ටීටීඊය එල්ල කල ප්‍රහාරයක් මැඩ පැවැත්වීම මගින් ආරක්ෂක හමුදා තවත් ජයග්‍රහනයක් අත් කර ගත් බව ඔහු ඊයේ පැවසී ය. එවැනි ප්‍රකාශ එල්ටීටීඊය මගින් සුපුරුදු ආකාරයෙන් ප්‍රතික්ෂේප කරනු ලබයි.

ආන්ඩුවේ බලධාරින් ප්‍රදේශය තුල දැඩි පියවරයන් ක්‍රියාවට දමා ඇත. ප්‍රදේශයේ දෙමල ජනතාව පීඩාවට පත් කිරීමේ සහ බිය ගැන්වීම සඳහා ආරක්ෂක හමුදාවන් විසින් යොදා ගනු ලබන පරීක්ෂන කපොලු, සෝදිසි මෙහෙයුම් සහ අනන්‍යතාව පරීක්ෂා කිරීමේ පාලන තන්ත්‍රයට ප්‍රදේශය තුල පූර්න ඇඳිරිනීතිය පැනවීමත් එකතු කර තිබේ. සමහර ප්‍රදේශවල සඳුදායින් පසුව ඇඳිරි නීතිය ඉවත් කර ඇත්තේ පැයක් හෝ දෙකක් පමනි. බ්‍රහස්පතින්දා පැය හතරක් හැර සෙසු සම්පූර්න කාලය ම ඇඳිරි නීතිය පනවා තිබුනි.

ආහාර හිඟකම වර්ධනය වෙමින් තිබේ. සහල්, පාන් පිටි, මස්, මාලු, සහ පලතුරු වැනි මූලික ද්‍රව්‍ය දුර්ලබ ය. මූලික ආහාර ද්‍රව්‍ය ටොන් 5,000 දිස්ත්‍රික්කයට වහාම එවන ලෙස යාපනයේ යාපනයේ ආන්ඩුවේ ඒජන්ත කේ. ගනේෂ් ආන්ඩුවෙන් ඉල්ලා තිබේ. කෙසේ නමුත් සටන් හේතු කොට ගෙන දකුනු ප්‍රදේශයට පවතින මාර්ග සම්බන්ධතා කපා හැර ඇති හෙයින් කවර සැපයීම් වුවද ගෙන ආයුත්තේ මුහුදෙන් සහ ගුවන් මගිනි. ඉහල යන අනාථයන්ගේ සංඛ්‍යාව නිසා සමාජ අර්බුදය උග්‍ර වී තිබේ. දිවයිනේ නැගෙනහිර ප්‍රදේශවල සටන්වලදී කලා මෙන් ගුවන් ප්‍රහාර, මල්ටි-බැරල් රොකට් විදින සහ කාලතුවක්කු වගවිභාගයක් නැතිව යොදා ගනිමින් එල්ල කරන ප්‍රහාර සාමාන්‍ය ජනයා මරනය පත්වීම සහ දහස්ගනන් අවතැන් වීමට හේතු වී තිබේ. වර්තමාන සටන් නිසා 135,000 ජනයා අවතැන් වී සිටින බව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනාථයන් පිලිබඳ කොමසාරිස් තක්සේරු කරයි.

ෆාමසි ඉදිරිපිට පෝලිම් මීටර් 300 පමන දිගට තිබෙන බව වාර්තා වී තිබේ. විදුලිය සහ ඉන්ධන යාපන අර්ධද්වීපයේ නැත. දුරකථන කිහිපයක් පමනක් ක්‍රියා කරයි:

දුරකථනයක් පාවිච්චි කිරීම සඳහා පැය ගනනක් පෝලිමේ සිටීමෙන් පසුව - මෙය ප්‍රදේශයේ පොදු භාවිතයක් බවට පත්ව ඇත - ලෝක සමාජවාදී වෙබ් අඩවියේ වාර්තාකරු පහත සඳහන් වාර්තාව සැපයී ය. ඇමතුම සඳහා ලබා දුන් කාලය සීමා සහිත නිසා වාර්තාව සංක්ෂිප්ත වුවද එය ප්‍රදේශය පුරා සිදුවන දේ පිලිබඳව දැක්මක් සම්පාදනය කරයි:

අගෝස්තු 11 සවස 7.00 පමන මුහමලෙයි, නගර්කෝවිල්, මන්ඩතීව් සහ අල්ලායිපිඩ්ඩි ඇතුලු විවිධ ප්‍රදේශවල දී එල්ටීටීඊය විසින් හමුදාවට ප්‍රහාර එල්ල කිරීම ආරම්භ විය. අල්ලායිපිඩ්ඩි ශ්‍රී ලංකා නාවික හමුදා පාලනය යටතේ පවත්නා යාපනය නගරයේ සිට කිලෝමීටර් හතක් පමන දුරින් පිහිටි කුඩා දිවයිනකි. එල්ටීටීඊය සහ ආරක්ෂක හමුදා අතර ගැටුම් ඇවිලුන නිසා ප්‍රදේශයේ පදිංචිකරුවෝ ශාන්ත ෆිලිප් නේරි පල්ලියේ නවාතැන් ගත්හ. ආන්ඩුවේ සොල්දාදුවන්ට කිලෝමීටර් කිහිපයක් පසු බැසීමට බල කෙරෙමින් එල්ටීටීඊය අල්ලායිපිඩ්ඩි අල්ලා ගත්තේ ය.

පසු දින උදෑසන පල්ලිය ඉදිරියේ පතිත වූ ෂෙල්වෙඩිවලින් හතර දෙනෙකු මරනයට පත් කරමින් සහ තවත් බොහෝ දෙනෙකුම තුවාල ලැබූහ.

අල්ලායිපිඩ්ඩි යලි අල්ලා ගැනීමේ උත්සාහයේ දී හමුදාවට කිලෝමීටර් 20ක් පමන දුරින් පිහිටි පලාලි හමුදා සංකීර්නයේ සිට ප්‍රහාර එල්ල කරමින් සිටියේ ය. අවසානයේ දී එල්ටීටීඊය ඉවත් වූ අතර හමුදාව ප්‍රදේශය යලි අල්ලා ගත්තේ ය.

අසල්වැසි කයිට්ස් දූපතෙන් පවුල් 213ක් හෙවත් මිනිසුන් 750 ශාන්ත මේරි පල්ලියට පැමිනියහ. එහි වයස අවුරුදු පහෙන් පහල 66ක් සහ අවුරුදු දෙකෙන් පහල ළමයි 38ක් එතැන සිටිති. මිනිසුන් පලාආවේ තව දුරටත් අල්ලායිපිඩ්ඩිවලට ප්‍රහාර එල්ල වෙතැයි ඇති වූ භීතිය නිසා ය.

සරනාගතයන්ට අනුව 74ක් බරපතල තුවාල ලබා සිටිති. ඉන් 57 යාපනයේ ශික්ෂන රෝහලේ සහ 17ක් කයිට්ස් රෝහලේ ප්‍රතිකාර ගනිති. පල්ලියට ඒමට පෙර ඉරිදා රාත්‍රියෙහි බොහෝ දෙනා ආහාර හෝ ජලය නොමැතිව සැඟවී සිටියහ. අල්ලායිපිඩ්ඩි ප්‍රදේශයෙන් ජනයා ඉවත්ව යාම නාවික හමුදාව විසින් මාන්කුම්බන්ගමේ දී වලකනු ලැබී යඃ කිහිප දෙනෙකු පමනක් යාපනයට ඒමට සමත් වූහ.

ආන්ඩුවේ බලධාරීන් පල්ලියේ සිටින සරනාගතයන්ට ආහාර හෝ සෙසු ද්‍රව්‍ය සම්පාදනය කරන්නේ නැත. අවට ගම්වැසියන්ගෙන් ලැබෙන ආහාර සහ සෙසු ආධාර මත ඔවුහු යැපෙති. ධීවර සමිති සහ සමූපකාර ද ඔවුන්ට උපකාර කරති. බොහෝ දෙනාට වැසිකිලි පහසුකම් නැති හෙයින් පල්ලියේ බලධාරීහු රෝග පැතිරීම ගැන බියෙන් පසුවෙති.

ෂෙල්වෙඩිවලින් ඔහුගේ මාමා, නැන්දා, ආච්චි අම්මා, සහ සීයා මියගිය බව එක් අයෙකු අප සමග පැවසී ය. බිත්තියක් ඇඟ උඩට වැටීම නිසා ඔහුගේ පියාට ඇවිදීමට නොහැකි ය. ඔහුගේ සහෝදරයාගේ කකුලේ ෂෙල්වෙඩි කැබැල්ලක් තිබේ. නිවාසවලින් වැඩි හරියක් ෂෙල්වෙඩිවලින් විනාශ වී ඇත.

"හමුදාව ගම යලි අත් පත් කර ගත් විට ඔහුහු අප සියලුදෙනාගේ ම ඡායාරූප ගත්හ. ඔවුන් අපව එල්ටීටීඊ සාමාජිකයන් ලෙස සැක කොට අපෙන් ප්‍රශ්න කලා. සමහර අයට පහර දුන්නා. අපට ආපසු අල්ලායිපිඩ්ඩිවලට යන්න බැහැ. අප එහි දී බොහෝ අනතුරුවලට මුහුන දෙනවා." එක් පුද්ගලයෙකු අප සමග පැවසී ය.

"රාත්‍රියෙහි අපට බෝම්බවල සද්දය ඇහුනා. ලමයි සමග කොහෙට දුවනව ද කියලා අප දැනගෙන හිටියෙ නැහැ. කොහේ වත් නොගිහින් ඇතුලත සිට බන්කර් හදන්න කියලා එල්ටීටීඊ සාමාජිකයෝ අපට කිව්වා . කෑමත් නැතිව දවස් දෙකක් අපි බන්කරයක් ඇතුලෙ හිටියා. පසුව පූජකතුමා අපව බසයකින් මෙහෙට ගෙනාවා." ගෘහනියක් පැවසුවා ය.

කයිට්ස් සහ සෙසු තැන්වල ජනයාගේ ආහාර අහවරවේගන යනවා. එලවලු නැත. මිනිස්සු ලූනු සමග බත් හෝ කරවල ස්වල්පයක් සමග කවලම් කල බත් ආහාරයට ගනිති. එය අතිශයින්ම දුෂ්කර තත්වයක්. අල්ලායිපිඩ්ඩිවලට කරෙයිනගර්වලින් පැමින සිටින සමහර කාන්තාවෝ මාලු ඇල්ලීමට උත්සාහ කරති. ඔවුන් එසේ සිතුවේ ඔවුන් කාන්තාවන් නිසා ඔවුන්ට නාවික හමුදාව පහර නොදෙතැයි ඔවුහු සිතුහ. නාවික භටයෝ ඔවුන්ට කෙවිට්වලින් පහර දී එලවා දැමූහ.

සෑම දෙනෙකුටම යුද්ධය අවසන් වීම දැකීමට අවශ්‍යයි. නමුත් ආන්ඩුව හෝ එල්ටීටීඊය සටන් නතර කරනු ඇතැයි ඔවුහු විශ්වාස නොකරති.

© www.wsws.org